**මැදදුම්බර ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ රු. 3,241,804 ක ඇස්තමේන්තුගතකර ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති 08 ක් දෝෂ සහගතව ණය හිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණි. | මු.රෙ 104 (4) පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.20,376,960 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | පෙර වර්ෂ ලැබීම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළ බව. | නිවැරදිව ආදායම් ගිණුම් ගතකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු මුදල රු.18,163 ක් හා විවිධ වියදම් රු. 475,739 ක් වර්ෂයේ වියදම් ලෙස හර නොකර සමුච්චිත අරමුදල හර කර තිබීමෙන් රු.493,602 ක් වියදම අඩුවෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පොදු තැන්පත් ගිණුමේ ශේෂය උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 14,172,672 ක වෙනසක් පැවතුණි. | විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන බව | වෙනස හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.7,112,061 ක වත්කම් ශේෂ 03 ක හා වගකීම් ශේෂයකට අදාළ ඔප්පු හා වෙනත් ලියවිලි, භෞතික පැවැත්ම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ශේෂ සනාථන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශේෂ තහවුරු කර ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2021 ජූලි 08 දිනැති 2235/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කළ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ සංශෝධනය 84 ඡේදය | අනුමත කරන ලද සංවර්ධන බලපත්‍රය හා සංවර්ධන සැලැස්මට අනුව නිම කර පදිංචි වීම සඳහා අනුකූලතා සහතිකයක් ලබාදිය යුතු වුවත්, 2021 සිට ඉකුත් වර්ෂය දක්වා කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 141 ක් සම්බන්ධයෙන් අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අදාළ පාර්ශව වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 (3), 104(4) | අයකර ගත නොහැකි රථ වාහන නැවතුම් පල ගාස්තු, ජල ගාස්තු, සේවක ණය, ණය හිමි/ණයගැති ගැටළු සහගත ශේෂ අයිතම 04 ක් සඳහා අදාළ පරීක්ෂණ අවසන් කර | අදාළ පරීක්ෂණ සිදු කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අලාභ රු.4,108,899ක් අයකරගෙන නොතිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 571 (3) | 2017 සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ කාලය ඉකුත් වූ විවිධ තැන්පත් එකතුව රු.1,471,114 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2010 නොවැම්බර් 24 දිනැති අංක 05/2010 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබියදී මහජන සම්බන්ධතා නිලධාරිවරයකුට 2018 සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.1,213,833 ක දීමනා ගෙවා තිබුණි. | නොදැනුවත්ව අදාළ දීමනාව ගෙවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.54,122,301 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 32,917,402 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,881,894 | 2,126,773 | 2,329,659 | 818,753 | 1,772,630 | 2,113,297 | 2,494,108 | 1,021,640 |
| (ii) | කුලී | 3,839,400 | 3,901,286 | 4,628,568 | 1,529,058 | 1,272,339 | 3,668,192 | 5,354,029 | 2,256,340 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,150,225 | 3,648,165 | 3,696,215 | - | 3,544,196 | 2,526,735 | 2,685,485 | 48,050 |
| (iv) | වෙනත් ආදායම් | 31,032,187 | 48,192,037 | 29,691,524 | 83,522,323 | 69,704,926 | 55,664,536 | 56,934,801 | 65,021,810 |
| | | 39,903,706 | 57,868,261 | 40,345,966 | 85,870,134 | 76,294,091 | 63,972,760 | 67,468,423 | 68,347,840 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.677,683 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ දේපල 08 කින් එකතුව රු.85,138 ක් විය. | දේපල තහනම් කිරීම සඳහා විනිග්‍රහ බලපත්‍ර නිකුත් කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | **කඩ කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ කුලී රු. 1,529,057 ක් වූ අතර වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.1,075,621 ක බදු කුලී ශේෂයක් හා කඩ කුලී ශේෂය තුළ වර්ෂ 3-5 ත් අතර කාලයට අදාළ රු.41,305 ක් අයකර නොතිබුණි. | අදාළ පාර්ශව දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ආදායම් අයකළ යුතුය. |
| (ii) | තෙල්දෙණිය, ආර්ථික මධ්‍යස්ථානයේ පවතින කඩ කාමර 25 ක් සඳහා 2015 මාර්තු 02 දිනැති තක්සේරු වාර්තාව පදනම් කරගෙන කඩකුලී අයකර වසර 08 ක් ගත වී තිබුණද නව තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කරන බව | නව තක්සේරුව අනුව කුලී අයකළ යුතුය. |
| (iii) | රෝහල් වටරවුම පාර කඩකාමර 06 ක් සම්බන්ධයෙන් 1999 සභා යෝජනාවක් මඟින් සංශෝධනය කළ කුලී මුදලක් අයකර තිබූ අතර 2019 වර්ෂයේ සිදුකළ නව තක්සේරුව අනුව 2020 සිට 2023 කාලයට අදාළ රු. 415,298 ක කඩ කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.538,038 ක් හා මුද්දර ගාස්තු රු.35,129,755 ක් විය. | අයකරගැනීමට කටයුතු කරන බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් ජල ව්‍යාපෘති 02 ක සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E Coli) බැක්ටීරියා සාන්ද්‍රනය හා කොලිෆෝම් (Coliform) බැක්ටීරියා සාන්ද්‍රනය අයහපත් තත්ත්වයේ පැවතුණි. ඒ සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා බීමට නුසුදුසු අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | සෞඛ්‍ය පරීක්ෂණ උපදෙස් ලබාදී ඇති බව. | පිරිසිදු ජලය බෙදා හැරිය යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ආසන්න පළාත් පාලන ආයතන මඟින් අවශ්‍ය කාර්ය ඉටු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------ | -------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු.13,470,887 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.4,542,105 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.4,572,290 ක් අයකර නොතිබුණි. | අයකර ගැනීමට, මු.රෙ 104(4) පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.34,157,840 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.3,357,500ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.2,444,049 ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 1989-2017 කාලයට අදාළ ලැබීමට තහවුරු කිරීම් නොමැති මුද්දර ගාස්තු ආදායම රු. 8,283,993 ක් හා 2011-2016 කාලයට අදාළ හිඟ උසාවි දඩ රු.209,200 ක් පැවති අතර අදාළ ආයතනවලින් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ 104(4) පරීක්ෂණ ක්‍රියාත්මක කරන බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |

**3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | අවිගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.17,850,000 ක වාහන 07 ක් හා රු.177,500 ක් වටිනා ජල බවුසරයක් වසර 02 සිට 09 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කිරීමට හා අපහරණය කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කිරීමට හා අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් කඩ කාමර 02 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසා දමා තිබුණි. | වෙනත් එලදායි කාර්යයක් සඳහා යොදා ගන්නා බව. | එලදායි කාර්යයන් සඳහා යොදවා ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන කැබ් රථයක හා ජීප් රථ 02 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | සභාව සතුව පවත්නා ඉඩම් ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගෙන නොතිබූ අතර දේපල 59 ක හා ප්‍රජාශාලා 24 අයිතිය පවරා ගෙන නොතිබුණි. | පවරාගැනීමට කටයුතු කරන බව | අයිතිය පවරා ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 10 ක පුරප්පාඩු 22 ක් ද එක් තනතුරක අතිරික්තතා 08 ක් ද පැවතුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් අත්හිටුවා ඇති අතර රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව සංවර්ධන නිලධාරී තනතුර සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් අතිරික්තව ඇති බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුළත් කර තිබුණු එකතුව රු. 1,120,000 ක ව්‍යාපෘති 06 ක් ඉටු කර නොතිබූ අතර අයවැයගත නොකළ රු. 19,830,806 ක් වූ ව්‍යාපෘති 12 ක් ඉටු කර තිබුණි.මේ හේතුවෙන් අයවැය ලේඛන ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. | අදාළ ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වූ බව. | අයවැය ගත කළ ව්‍යාපාති ඉටු කළ යුතුය. |

### 4.2 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව. | තිරසර සංවර්ධන දර්ශක හඳුනාගෙන අරමුණු හා ඉලක්ක ඉටුකර ගත යුතුය. |